# නොබෙල් තෑග්ගෙන් දහසින් බැඳි පියල් ලද්දෝ

සාමය, සාහිත්‍යය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සහ ආර්ථික විද්‍යා ක්ෂේත්‍ර තුළින් මානව සංහතියේ දියුණුවට කැප වී උදාර සේවාවන් කළ අයට අවුරුද්දක් පාසා පිරිනැමෙන නොබෙල් තෑග්ග ගැන නංගිලා, මල්ලිලා දන්නවා ඇති.

මේ අවුරුද්දේ (1979) සාමය, සාහිත්‍යය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ආර්ථික විද්‍යාව සඳහා නොබෙල් තෑගි ලබා ගත් ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ගැන ඇතැම් විට ඔබ නොදන්නවා ඇති. ඒ අය ගේ කථාන්තරය දැන් අහන්න.

නොබෙල් තෑග්ග ලබන්නට වාසනාව ඇති කෙනෙක්, මිනිස් ජීවිතය උදෙසා උදාර තර සේවාවක් ඉටුකළ පුද්ගලයෙක් හැටියට ජාත්‍යන්තර වශයෙන් කීර්තියට පත් වෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ සැම කෙනෙකුට ම, එක් අයෙකුට ඩොලර් 1,90,000 බැගින් මුදලින් තෑගිත් ලැබෙනවා. ලංකාවේ සල්ලිවලින් නම් රුපියල් තිස් ලක්ෂයකට වැඩි මුදලක්

**සාමය**

1979 සාමය සඳහා පිරිනැමෙන නොබෙල් තෑග්ග ලැබුවේ ඉන්දියාවේ අසරණයින් වෙනුවෙන් තම ජීවිත කාලයම කැප කළ 69 හැවිරිදි තෙරේසා මව් තුමියයි. ඇය 'කාණුවේ සාන්තුවරිය' යනුවෙන් ද හැඳින් වෙන්නේ මුඩුක්කු ජීවිත ගත කරන දිළිඳු රෝගී පුද්ගලයින් වෙනුවෙන් ඇය ජීවිත පරිත්‍යාග යෙන් කර ඇති සේවය නිසා යි. ඇගේ සේවය නිරතුරුවම ලැබුනේ 'දුප්පතුන් ගෙන් දුප්පතුන්ටයි' .

මීට අවුරුදු 30 කට විතර ඉහත දී කල්කටාවේ මිනිසුන් ගෙන් පිරුණ වීදියක වැහැරී ගිය සිරුරකින් යුතු කාන්තාවක් සිහිසන් නොමැතිව වැටී සිටියා. ඇය ගේ සිරුරේ ඇතැම් තැන්වල පණුවන් නලියමින් සිටි අතර, මීයන් විසින් තවත් කොටස් කා දමා තිබුණා. ඇය වෙත නැඹුරු වූන රෝමානු කතෝලික පූජකවරියක් ඇයව



## දහසක් මල්

ඔසවා ගෙන සිය කුටියට ගෙන ගොස් ඇයව නහවා, ඇය අවසන් හුස්ම හෙලන තෙක් ඒ අසරණ ගැහැණිය අසල හිටියා. නොබෙල් තෑග්ග දිනූ තෙරේසා මවු තුමිය ගේ උදාරතර සේවාව ආරම්භ වූනේ ඔය විදිහට යි.

සාමය සඳහා වූ නොබෙල් තෑග්ග බොහෝ විට දෙන්නේ දේශපාලනය, ආර්ථික සංවර්ධනය හා පුරවැසි අයිතිවාසිකම් ආදි ක්ෂේත්‍ර වැඩ කරල මිනිසා ගේ පැවැත්මට රුකුල් දෙන විශිෂ්ඨ සේවාවන් කළ අයටයි. ඒත් තෙරේසා මව්තුමියට නොබෙල් තෑග්ග දෙන්න තීරණය කළ ස්වීඩන්යේ නොබෙල් කමිටුව ප්‍රකාශ කළේ 'දුප්පත්කම' කුසගින්න හා අසහනයන්' ලෝක සාමයට තර්ජනයක් බව යි.'

රටවල් කිහිපයක තියන රෝහල් ගණනාවක්, අනත් දරු නිවාස හා ලාදුරු රෝහල් නඩත්තු කරමින් කටයුතු කරන පූජකවරියන් 1,800 ක් හා සේවකයින 1,20,000 කින් සමන්විත පුණ්‍ය සේවාවක් මුලින් ම ආරම්භ කළේ තෙරේසා මවුතුමියයි.

ඇය නොබෙල් තෑග්ග දිනා ගත් බව ඇසූ හිතවතුන් හා දුප්පතුන් පැමිණ ඇගේ පා ස්පර්ශ කිරීම සිදු කළ අවස්ථාවෙහි දී ඇය ප්‍රකාශ කළේ දයාවෙන් කරන වැඩ සාමයට යොමුවන නිසා දුප්පතුන්ගේ නාම යෙන් තෑග්ග පිළිගන්නා බව යි.

ලාදුරු වැනි පිළිකුල් සහගත රෝග වලින් පෙළෙමින් පණ අදින ලෙඩුන් වෙත ගොස් ඔවුන් නහවා පිරිසිදු කර, ඔවුන් ගේ කසල බඳුන් ඉවත දමා ඒවා ද පිරිසිදු කිරීම වැනි වැඩ නිරතුරුවම කරන ඇය ඒවා සමාජ සේවයක් හැටියට වත්, තමා ගේ විමුක්තිය උදෙසා කරන සේවයක් ලෙසවත් සලකන්නේ නැහැ. 'මේ දෙවියන් වහන්සේගේ සිරුරයි. මේ සිරුරු අත ගාන අපි දෙවියන් වහන්සේ ගේ දේහය අත ගානවා' යනුවෙන් ඇය වරක් ප්‍රකාශ කළා.

තෙරේසා මවුතුමියට රජයෙන් පළමුවරට කල්කටාවේ කාලි කෝවිල ඉදිරිපස ධර්ම

ශාලාවක් ලැබුණ අවස්ථාවේ දී ඊට විරුද්ධ උන හින්දු ජාතිකයෝ ගල් මුල් විසි කර එහි ජනෙල් දොරවල් කඩා දැමුවා. ඒත් කොලරාව සෑදී පණ අදින මිනිහෙක් නාවා, කවා පොවා, ඔහු මැරෙන තෙක් ඔහුට සාත්තු කළ තෙරේසා මවුතුමිය දුටු කෝවි ලේ පූජකයා ඇය ඉදිරියේ දණින් වැටී ඇයට ගෞරවය පුදකළා.

ඇය ගේ අනුගාමික පූජකවරියන් ඇය ඉදිරියේ දිවුරුම් දෙන්නේ තඹයක්වත් අය නොකර දුගී දුප්පතුන්ට සේවය කරන්නයි. දුප්පතුන්ට වගේ ම මේ පූජකවරියන්ටත් තියෙන්නෙ වාම් සාරි දෙකක් විතරයි. ඒ අය් බොහෝ දෙනෙක් ඇවිදින්නෙ පා වහන් නොමැතිව යි.

නොබෙල් තෑග්ගෙන් ලද මුදලින් තෙරේසා මවුතුමිය ඉන්දියාවේ තවත් ලාදුරු රෝහලක් ඉදි කිරීමට අදහස් කරනවා. මේ තෑග්ග පිළිගැනීමට ස්වීඩනයට යන ත්‍යාගලාභීන් වෙනුවෙන් පැවැති වෙන භෝජන සංග්‍රහය ඇය වෙනුවෙන් නොපවත්වන ලෙස තෙරේ සා මවුතුමිය ඉල්ලා සිටියා. ඇගේ උදර සේවයට ගරු කිරීමක් වශයෙන් අසරණ යන්ට සරණ වීම පිණිස ඒ මුදලත් ඇයට ම තෑගි දීමට නොබෙල් කමිටුව තීරණය කළා.

## විද්‍යසාහිත්‍යය

සාහිත්‍යය සඳහා 1979 නොබෙල් තෑග්ග ලැබුවේන ග්‍රීක ජාතික ඔඩිසියස් එලිටිස්ට යි, ජාත්‍යන්තර වශයෙන් එතරම් ප්‍රසිද්ධියක් නොලද කවියෙක් වූ එලිටිස්ට නොබෙල් සාහිත්‍ය තෑග්ග ලැබීමෙන් ඔහුම පුදුමයට උනා. ලෝකය පුරා පතල නමක් එලිටස්ට නොතිබුණත්, ඔහු ග්‍රීසිය ඇතුළත ඉතාමත් ජනප්‍රිය කවියෙක්. ඔහු ගේ එකම ජීවනෝපාය කවි ලිවීමයි. ඔහු සිය සම්පූර්ණ ආදායම උපයන්නේ තමන් ලියන පොත් වලින්.

අවිවාහකයෙක් වන එලිටිස් ප්‍රසිද්ධියට අකමැති පුද්ගලයෙක්.

## භෞතික විද්‍යාව

භෞතික විද්‍යාඥයින් සෑම ප්‍රයත්නයක් ම දරන්නේ ස්වභාව ධර්මයේ ප්‍රධාන බලවේග හතර වන ගුරුත්වා කර්ශණය, විද්‍යුත් චුම්භකත්වයහ, දැබල සහ ප්‍රබල න්‍යෂ්ටිකා බලවේග එකට එක් කරන න්‍යායය සොයා ගැනීමටයි.

භෞතික විද්‍යාව සඳහා නොබෙල් තෑග්ග මෙවර පිරිනමන ලද්දේ මිනිස් සිතේ විශ් මය දනවන ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි විද්‍යා පර්යේෂණයකට යි. විද්‍යුත් චුම්භකත්වය හා දුබල න්‍යෂ්ටික බලවේග එක්තැන් කරන න්‍යායයන් මේ පර්යේෂණය මගින් ඇති කර තියෙනවා. මේ බුද්මධිය විප්ලවයේ හවුල් කරුවන් වී හාවාඩ් සරසවි යේ මහාචාර්යවරුන් වන 46 හැවිරිදි ෂෙල් ඩන් ග්ලැෂෝ මහතා සහ ස්ටීවන් වේන්බර්ග් මහතාත්, ලන්ඩන්හි ඉම්පිරියල් විද්‍යාලයේ අබ්දුස් සලාම් මහතාත් භෞතික විද්‍යාව සඳහා 1979 නොබෙල් තෑග්ග දිනා ගත්තා.

විද්‍යාත්මක ලෝකයේ ඉතාමත් දුෂ්කර අංශයක් වන භෞතික විද්‍යා ක්ෂේත්‍රයෙහි මේ ලත් ජයෙන්, ලෝකයේ සෑදී තිබෙන ආකාරය වටහා ගැනීමට මිනිසා මෙතෙක් දැරූ ප්‍රයත්නයන් තවත් පියවරක් මේ පර් යේෂණ මගින් ඉදිරියට යොමු වන බව මේ විද්‍යාඥයින් ගේ අදහස යි.

## රසායන විද්‍යාව

රසායන විද්‍යාව සඳහා 1971 නොබෙල් තෑග්ග නිමිත්තෙන් පර්ඩියු සරසවියේ මහා චාර්ය හර්බට් බ්‍රවුන්ට සහ බටහිර ජර්මනි යේ හයිඩල්බර්ග් සරසවියේ ජෝර්ජ් පිටින් ටයි. තෑග්ග පිරිනැමුනේ ඔවුන් දෙදෙනා විසින් පොස්පරස් සංයුති පිලිබඳව රසායන විද්‍යා ක්ෂේත්‍රයේ ඉටු කර ඇති වැඩ කොටස සඳහා යි. පොස්පරස් සංයුතීන් අනුසාර යෙන් නව බෙහෙත් වර්ග හා රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයේ දියුණුවට ඉමහත් රුකු ලක් ලැබෙනවා.

## ආර්ථික විද්‍යාව

ආර්ථික විද්‍යාව සඳහා වූ නොබෙල් ත්‍යා ගය බොහෝ විට ලැබෙන්නෙ, දුප්පත් පත්කම, ජනගහණ ව්‍යාප්තිය නූගත්කම ආදියෙන් ලෝකය මුදවා ගැනීමේ ප්‍රයත්න යක යෙදෙමින් විශිෂ්ය සේවාවන් ඉටු කරන සංවර්ධන විද්‍යා වේදීන්ට ය. 1977 ආර්ථික විද්‍යා නොබෙල් ත්‍යාගය දිනා ගත්තේ ප්‍රින්ස්ටන් සරසවියේ ආතර් ලුවී සහ චිකා ගෝ සරසවියේ තියඩෝර් ඩබ්ලිව්. ෂුල්ට්ස් යන සංවර්ධන විශේෂඥයින් දෙදෙනාට යි.

ආර්ථික සංවර්ධනය සිදු කළ ඩැකි ක්‍රියා මාර්ග ඉදිරිපත් කර ඇති විද්‍යාඥයින්ගේ වශයෙන් ආතර් ලුවී ජාත්‍යන්තර කීර්තියට පත් පුද්ගලයෙක්. ඔහු තර්ක කලේ ගොවි

කටයුතු අංශයේ සීඝ්‍ර වෙනස් වීමකින් තොරව ආර්ථික සංවර්ධනයක් ඉටු කළ නොහැකි බව යි.

ආතර් ලුවී සංවර්ධනය වෙමින් පවතින රටක්වන ශාන්ත ලුෂියා නමැති බටහිර ඉන්දීය දූපතේ උපත ලැබූ කෙනෙක් බටහිර ඉන්දීය සරසවියේ උප සභ. සෙ කටයුතු කරමින් ඉටු කළ සේවයා නිසා 1963 දී ඔහුට නයිට් නාමයක් ද ලැබුණා.

ආර්ථික විද්‍යා නොබෙල් ත්‍යාගය හිමි අනක් තැනැත්තා වන ෂුල්ටස් සාමාන්‍ය යෙන් ප්‍රායෝගික පැත්තට නැඹුරු උන ජනෙක්. ඇමෙරිකාව වගේ රටවල් විශාල වශයෙන් ධාන්‍ය වර්ග දුක්පත් රටවල්වලට දෙනවාට ඔහු විරුද්ධයි. ෂුල්ට්ස් කීයන්නෙ, එයින් ඒ රටවල්වල ආර්ථික සංවර්ධනය උදෙසා තියන උද්‍යෝගය නැති වෙනවා කියල. වඩාත් හොඳ අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා මුදල් යොදවා 'මිනිස් ප්‍රාග් ධනය' මුලින් දියුණු කළයුතු බව ඔහු ගේ අදහසයි.

මෙවැනි සංවර්ධන විද්‍යා වේදීන් දෙදෙනෙකුට නොබෙල් තෑග්ග හිමිවීමෙන් පැහැදිලි වන එක් කාරණයක් නම් දුප්පත් රට වල් වල ගැටළු රන්තර් ජාතික වශයෙන්ට සැලකිල්ලට යොමු වන බවයි.